හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

අපි ගිය කලාපයේ හොඳ සිංහල ලිපිය මා අවසන් කලේ මෙම ලිපියෙන් 'ගමන් බල පත්‍රය' ගැන පිවිසුමක් කරන බව කියමිනි.

එම ලිපියේ මා ලියා ඇති 'විසය - කටින ජලය - මුර්දු ජලය - ප්‍රකුර්තිය' යන වචන දැන් (කලක සිට) එසේ වැරදියට ලියන්නේ ඇයි දැයි අපේ හිතවත් පාඨකයෙක් මගෙන් ඇසීය.

පලමුවෙන් ම එයට උත්තර දීම මැනවැයි සිතමි. කෙසේ උවත් එය ඉතා කෙටියෙන් කිරීමට උසා (උත්සාහ) කරමි.

'සර්ප විෂ' වියහරේ දී 'සර්ප විස' වන නිසාත් 'විසකුරු සර්පයන්' කොලු විසේ (විසය) නාකි විසේ (විසය) යන වහරක් අප අතර ඇති නිසාත් 'විෂයය' යන්න 'විසය' යනුවෙන් ලිවීම වරදක් විය නොහැක. සුද්ද සිංහල හෝඩියට ශ/ෂ අයත් නැති නමුත් ශ් - ශ් - ශ්, ශිහ්, ශුහ්, ශෝ (මෙය ලියන්නේ ෂ් - ෂ් - ෂ්, ෂිහ්, ෂුහ්, ෂෝ යනුවෙන් ද යන්න මම නොදනිමි. මා ෂ්/ශ් දෙකම කියන්නේ එකම හඬිනි.) යන හඬ ලිවීම සඳහා 'ශ' යන්නක් හෝ 'ෂ' යන්නක් අවශ්‍ය බව පිළිගත යුතුය.

ශ්‍රී ලංකා, ශ්‍රේෂ්ට යන වචන පවා අප කියවන්නේ ශ්‍රී

'කෘත්‍රිම' යන වචනය 'කෘතිම' යනුවෙන් ලියන සමහරු එය ක්‍රරුතිම කුර්තිම, යන විදියට කියවන සැටි ඔබට ඇසී ඇතැයි සිතමි. 'ක්‍ර්‍ ත් ‍ර්‍ ම' යනුවෙන් කියවිය යුතු එය සිංහල වියරන රිති අනුව 'රුතිම - රිතිම - රිත්ම' වැනි වචනයකින් පිරිමසා ගත හැකිය. (ක්ෂිතිජය , සිතිජය වීම මෙනි.) ක්ෂිතිජය සහ ලක්ෂණ යන වචන දෙක සිතිජය සහ ලස්සන වීම කිසිවකුගේ ඇසේ කැස්මකට හේතු වී ඇති බවක් නොදනිමි.

ලංකා, ස්‍රේස්ට යනුවෙන් බව පිළිගැනීමට ඔබ මැලිවිය හැකිය. එහෙත් ඇත්ත එයයි. මා කිසිම තැනක 'ශ්‍රී' යන්නක් දැක නැති නිසා ඉංගිරිසියේ zSHZ අකුරු දෙකින් නැඟෙන හඬ දැක්වීම සඳහා 'ශ්' සුදුසු යයි සිතමි. 'විෂයය' යන්න 'විසය' යනුවෙන් ලිවීමේ දී අපට දැනෙන්නේ ඇසේ හුරුවයි.

'කොෆී, ටී' යන ඉංගිරිසි වචනය ඒ හැටියට නොගෙන 'කෝපි, තේ' යනුවෙන් සිංහල වෙස් ගන්වා අපි භාවිතා කරමු. විෂයය, විසය විමත් එවැන්නකි.

ඒ අනයමින් කඨින (කටිගින), මෘදු (මිර්දු), ප්‍රකෘතිය (පර් ක්‍ර්‍ තිය), කෘතිය (ක්‍ර්‍ තිය) වැනි සකු වචන අපේ කටට හුරු විදිය ම ඇසට ද හුරු කර ගැනීම බස් වහර තිරවුල් කර ගැනීමක් නොවන්නේද? (සකු) අශුභ, (පාලි) අසුභ, (සිං) අසුභ වීම වරදක් නම් අපේ සුබසිංහලාට ශුභසංහ හෝ සුභසිංහ යනුවෙන් නම වෙනස් කර ගැනීමට සිදුවේ. ප්‍රකෘතියේ (ප්‍රකුර්තිය), කෘ, කුර්, කෘතියේ (ක්‍රරුතිය), කෘ, ක්‍රරු, වෘක්ෂයේ (විරුක්ෂ), වෘ, විරු, වෘකයාගේ (වුර්ක), වෘ, වුර් වන සැටි තේරුම් ගන්න. එසේ නම්, ප්‍රකුර්තිය, ක්‍රරුතිය, විරුක්ෂය, වුර්කයා යනුවෙන් ලිවීම වරදක් විය හැකිද ?

වෘක්ෂය (ව්‍ර් ක් ෂ ය) විරුක්ෂ වී, විරුක්ෂය රුක්ෂ වී, රුක්ෂ රුක් / රුස්ස වී අනතුරුව රුස්ස යන වෙනත් තේරුමක් දෙන වචනයක් නිර්මානය වේ. 'රුස්ස ගස්' යනු උසින් මහතින් වැඩි ගස්ය.

'කෘත්‍රිම' යන වචනය 'කෘතිම' යනුවෙන් ලියන සමහරු එය ක්‍රරුතිම කුර්තිම, යන විදියට කියවන සැටි ඔබට ඇසී ඇතැයි සිතමි. 'ක්‍ර්‍ ත් ‍ර්‍ ම' යනුවෙන් කියවිය යුතු එය සිංහල වියරන රිති අනුව 'රුතිම - රිතිම - රිත්ම' වැනි වචනයකින් පිරිමසා ගත හැකිය.

(ක්ෂිතිජය , සිතිජය වීම මෙනි.)

ක්ෂිතිජය සහ ලක්ෂණ යන වචන දෙක සිතිජය සහ ලස්සන වීම කිසිවකුගේ ඇසේ කැස්මකට හේතු වී ඇති බවක් නොදනිමි.

'හරි ලක්සනයි හරි ලස්සනයි මැනිකෙගෙ සුදු සේලේ' යන තැනත් 'ලස්සන රත්තරං බබෝ' යන තැනත් ඇත්තේ 'බලමින් ලකුණු ගත - දුදන ගුණ යන තැන අති 'ලක්ෂණ' යන තේරුම නොවේ. 'පුණ්‍ය ලක්ෂණ - පින් ලකුණු' යනුවෙන් පොතේ ලියවේ. අපි එය 'පින් පාට' යනුවෙන් ඉතා මට සිළිටි සරල බසින් කියමු.

බොහෝ සකු වචන පැදි/ කවි ලිවීම සඳහා බිඳගෙන ඇති විදිය සාමාන්‍ය වියහරට අමුතුය. 'පාණ්ඩු කම්බල ශෛල ආසනය' (පාණ්ඩු කම්බල ශෛලාසනය' කෙනෙකුට 'පඩුපුල් සුලසුන' ය; තවත් කෙනෙකුට 'පඩු ඇඹුල' ය. එහෙත් පාණ්ඩු, පඩු, කම්බල, කඹුල්, ශෛ, සල, ආසනය, අසුන යන විදියට බිඳ ගත් විට හැඳෙන්නේ 'පඩුකඹුල් සලසුන' ය. එය පඩුපුල හෝ 'පඩු ඇඹුල' යනුවෙන් කෙටියෙන් ලිවීම ඉතා හොඳය. 'පඩපුල' යනු 'කුෂන්' කරන ලද ගල් ආසනයක් බව එය දැක බලා ගෙන පැමිණි අය කියති.

සුද්ධෝදන - ශුද්ධොදන - සුදෝවුන් (සුද්දෝදන) සිද්ධාර්ථ - (සිදු, අරුත්, සිදරුත්/සිදුරුත් විය යුතුය.) සිදුහත් (සිද්දාර්ත), බුද්ධඝෝෂ - බුදුගොසේ (බුද්දගෝස) ආයුධ - අව් (ආවුද), විශ්වාස - විස්වස් (විස්වාස) යන වචන අපට කියවෙන හැටි වරහන් තුල දැක්වේ.

CHIMPANZEE (චිම්පන්සි), CHIMP (චිම්ප්), HIPPOPOTAMUS (හිපපොටේමස්), HIPPO (හිපෝ), CROCODILE (ක්‍රොකායිල්) CROCO, BRASSIERE (බ්‍රෙසියර) BRA (බ්‍රා) යන වචන ඉංගිරිසි පුවත්පත්වල දක්නට ලැබේ. මොනර කිකිළි, මොනරකිළි, ඇටිකුකුළු, ඇටිකුළු, පඩු කඹුල, පඩුපුල් ආදී වශයෙන් වචන කෙටි කිරීම අපට අරුමයක් නොවේ. එය අපේ බසේ ඉතා පැරනි වියරන රිතියකි.

දැන් අපි 'ගමන් බල පත්‍රය' ගැන කතාවක් අරඹමු. ඉංගිරිසියේ 'ටිකට්' යන වචනය විවිධ අරුත් දෙන්නකි. අපි 'බල පත්‍රය' හෙවත් 'වරපත' යන තේරුම දීම සඳහා ටිකට් එක/ ටිකැට්ටුව බාවිතා කරමු. එය 'ටිකටුව, ටිකටිය, ටිකට්ට, නොවී ටිකට්ටුව වූයේ ඇයි දැයි මම නො දනිමි. ටිකට්ටුව, කැරැට්ටුව, රොකට්ටුව, බෝට්ටුව, ආදිය ඒ විදියට වහරට පැමින ඇති බව පෙනේ. ඒ වචන සමුලු පවත්වා හදා ගත් ඒවා නොව එකකුගේ නිර්මානයක් බව සැලකිය හැකිය. ඔහුගේ බාසා දැනීම අනුව එය නිර්මානය වේ.

වෙනත් බාසාවකින් වචන ගැනීමේදී වහරේ පවතින වචන ඇසුරෙන්ම අලුත් වචන හැදීමේ 'මෙනියාව' නිසා 'අපමුඛ්‍යස' වචන බසට ඇතුල් වී ඇති හැටි 'සර්ව ලෝක පූට්ටුව' වැනි වචන වලින් පෙනේ. සර්ව ලෝක (සකු) පූට්ටුව (දෙමල) සර්ව ලෝක පූට්ටුව (සිංහල).

NEWS PAPER අපට අලුත් වචනයකි. ඒ සඳහා 'ප්‍රවෘත්ති පත්‍රයට' වඩා 'පුවත් පත' වහරට පැමිණ ඇත. එය දැන් අපේ ඇහැට මෙන්ම කටට ද හුරුය. එහෙයින් අපට 'ටිකට් එක' වෙනුවට බලපත හෝ වරපත බාවිතා කල හැකිය. පෙලපත, කොලපත, පැලපත, පැල්පත, ඉලපත, කටට හුරු අපට බලපත හෝ වරපත අරුමයක් විය නොහැකිය.

බසයෙන් ගියත්, නැවෙන් ගියත්, ගුවන් යානයෙන් ගියත්, බලපතක් තිබිය යුතුය. එය ගමන් බල පතකි; නොහොත් ගමන් වරයකි. සිතමා හලකට හෝ රැගුම් හලකට පිවිසීම, වැදීම, (ගෙවැදීම) සඳහා ද බලපතක් තිබිය යුතුය. එය පිවිසුම් වරයකි; නොහොත් වැදුම් වරයකි. මෙය ප්‍රසූතිය සඳහා වර පතක් ලෙස තේරුම් ගන්නා බහු බූතයන්ට ගෙවැදීමේ දී වදන්නේ කුමක්දැයි නොතේරෙන්නන්ට හේතුවක් නැත.

රටකින් රටකට ඇතුලු වීමේදීත් බලපතක් අවැසි වේ. එය සිනමා හලකට වැදීමේදී තිබිය යුතු බලපතක් වැනිය. මගේ දුප්පත් ඉංගිරිසි දැනුම අනුව PORT PASS යන්න පද පෙරලියකින් PASS PORT යන තනි වචනයක් වී ඇතැයි සිතමි.

අපේ බසේ 'රන්, මසු' මසුරන් වන්නේත්, වා පස් දහස පස්වාදහස වන්නේත් පද පෙරලියෙන් බව ඔබ දනිති.

ඇත්තටම එය 'පාස්පොට - පාස්පට - පාස්පත - පහස්පත' වැනි වචනයකින් හඳාගත හැකිය. එය යසිලය, සැසිය, ශෛලම, පෑන, පැන්සල වැනි 'තත්සම' වචනයකි.

මගේ යහලුවකු එය හැඳින්වූයේ -පස්පොට"

කියාය. මං හෙට කොළඹ යනවා මගේ 'පස්පොට' අලුත් කරගන්න. ඔහුගෙන් එම වචනය බෝ වී ගියේය. ඔහුගේ යහලුවන් කීප දෙනෙකුටත් දැන් 'පස්පොටවල්' ඇත.

අපේ 'පුරවැසියා සහ පුරවැසි භාවය' ඉංගිරිසියේ Citizen සහ Citizenship යන වචන අනුයමින් හදා ගත් වචන යයි සිතමි. ග්‍රීසියේ පැවති -City States - පෞර රාජ්‍ය' නිසා ඒ ඉංගිරිසි වචන ඇතිවුනා විය හැකිය. Prot pass (passport) යන වචනයට ද එය බලපාන්නට ඇත.

අපට තිබුනේ රටවැසි -රැටි වැනි වචනයි. එහෙත් ඒ වචන ගැන තැකීමක් නො කොට Citizen යන වචනයේ අදහස දෙනු පිණිස 'පුර වැසි' වචනය හදා ගන්නට ඇත.

ශ්‍රී ලාංකේය මාධ්‍ය කවුලුව
ගොඩවන්න
www.thisara.com

මානවඩු ගේ මාසය

Lead Accounting & Taxation Services
Public Accountant and Registered Tax Agent

Refunds within 14 days
Tax Returns 2007

ශ්‍රී ලාංකික ඔබට සුහද සේවය

Services
- Individual/ Business/ Investment Property Tax Returns
- Accounting/ Bookkeeping
- Preparation of Business Activity Statements(BAS)
- Audit of Non-for-Profit Organization and Self-Managed Superannuation Funds
- Personal Service and Advice

L. A. Dayananda Wimalasiri PNA
B.Com, M.Com, M.Bus, Ad.Dip.Acct.

Office
1/1324 Centre Rd, Clayton 3169
TP 03 9544 4995
Fax 03 9544 4997

After Hours
7 Whitton Court, Rowville 3178
P/F 03 9755 7400
M 0402 846 676

leadtax@iprimus.com.au

NIA NATIONAL INSTITUTE OF ACCOUNTANTS
PNA

Kusumsiri - Lead Design House 0430 112 088